ආත්මනේපදය පිළිබඳ අෂ්ටාධ්‍යායී සහ කාශිකාවෘත්ති ආශ්‍රිත අධ්‍යයනයක්

# [A Study of *Ātmanepada* with Reference to the *Aṣṭādhyāyī* and the *Kāśikāvṛtti*]

**Baladora Indrajothi** [1]


## Abstract

This study, titled as A Study on Ātmanepada in the *Aṣṭādhyāyī* and the *Kāśikāvṛtti*, examines the concept and formation of *Ātmanepada* as presented in Pāṇini's *Aṣṭādhyāyī*, with a specific focus on its interpretation and elaboration in the *Kāśikāvṛtti* by *Vāmana* and *Jayāditya*. The research follows a textbased analytical methodology, grounded in a close reading of *Aṣṭādhyāyī* sutras and their commentaries in the *Kāśikāvṛtti*. Emphasis is placed on key sūtras which form part of the larger discourse on the assignment of *Ātmanepada* endings to verbal roots. Furthermore, contemporary digital resources were utilized to crossreference interpretations, examine sūtra sequences, and access variant explanations. The analysis includes selected roots (*dhātus*) to demonstrate how contextual factors such as reflexivity, benefit to the agent, or internalized action influence the assignment of *Ātmanepada* forms. By integrating classical grammatical theory, the study offers a nuanced understanding of how *Ātmanepada* functions within the *Aṣṭādhyāyī*'s theoretical framework and its traditional commentarial expansions. This research contributes to the ongoing scholarly discourse in Sanskrit grammar and Pāṇinian studies.


**Keywords**: *Ātmanepada, Aṣṭādhyāyī, Kāśikāvṛtti, Jayāditya, Vāmana*

1 Senior Lecturer, Department of Languages, Bhiksu University of Sri Lanka.
E-mail: b.indrajothi@busl.ac.lk, https://orcid.org/0009-0008-3974-2518

**හැඳින්වීම**

සංස්කෘත ව්‍යාකරණයේ සුවිශේෂ ලක්ෂණයක් ලෙස පදගත සියුම් වෙනස්කම්වලින් සියුම් විවිධාර්ථ ප්‍රකාශ කිරීමේ හැකියාව දැක්විය හැකි ය. එහි එක් ප්‍රභේදයක් ලෙස ක්‍රියා පද හඳුනාගත හැකි ය. ක්‍රියා පදයන්ගේ සාධනය සිදු වන්නේ ක්‍රියා මූලයන්ගෙනි (ධාතුවලිනි). සංස්කෘත භාෂාවේ ක්‍රියා මූලයන් පරස්මෛපද, (परस्मैपदनिः) ආත්මනේපද (आत्मनेपदनिः) සහ උභයපද (उभयपदनिः) ලෙස වර්ගීකරණය වේ. පරස්මෛපද යන්නෙහි අර්ථය "අන් අය සඳහා", යන්න යි. ආත්මනේපද යන්නෙහි අර්ථය "තමන් සඳහා" වන අතර උභය යන්නෙහි අර්ථය "බාහිර පුද්ගලයන් සහ තමන් අයත්" යන්න යි. ඒ අනුව අන් අයගේ ප්‍රයෝජනය සඳහා කරන ක්‍රියාවන් පරස්මෛපදයෙන් ප්‍රකාශ වේ. තමන්ගේ ප්‍රයෝජනය සඳහා කරන ක්‍රියාවන් ආත්මනේපදයෙන් ප්‍රකාශ වේ. ධාතුවක් පරස්මෛපදයේ වරනඟා ගැනීමට යොදාගන්නා ප්‍රත්‍ය මාලාවක් සහ ආත්මනේපදයෙහි වරනඟා ගැනීමට යොදා ගන්නා ප්‍රත්‍ය මාලාවක් වේ. ඇතැම් ධාතු එකී පරස්මෛපදයෙහි පමණක් වරනැඟෙ යි. ඒ නිත්‍ය පරස්මෛපද ධාතු ය. ඇතැම් ධාතු යම් යම් උපසර්ග සමඟ යෙදුන විට පරස්මෛපදයෙහි වරනැඟේ. අෂ්ටා ධ්‍යායී 1.3.78 සූත්‍රයට අනුව පරස්මෛපදයට අදාළ කොන්දේසිවලින් තොර සියලු ධාතු පරස්මෛපදයෙහි වරනැඟෙයි. ඇතැම් ධාතු ආත්මනේපදයෙහි පමණක් වරනැඟෙ යි. අෂ්ටාධ්‍යායි 1.3.72 සූත්‍රයෙන් ඊට අදාළ ප්‍රධාන කොන්දේසිය දැක්වෙන අතර 1.3.12 සිට 1.3.77 දක්වා සූත්‍රවලින් විවිධ හේතු මත ආත්මනේ පදයෙහි වරනැඟෙන ධාතු පෙන්වා දෙයි. ඒ අනුව කුමන ධාතු ආත්මනේ පදයෙහි වරනැඟේ ද? කුමන ධාතු පරස්මෛපදයෙහි වරනැඟේ ද? කුමන ධාතු උභය පදයෙහි වරනැඟේද යන්න ධාතු පාඨයේ පැහදිලි ව දක්වා තිබේ. උක්ත පරස්මෛපද හෝ ආත්මනේපද යන අංශ දෙකෙන් අවශ්‍ය අංශයකට යොදා වරනඟාගත හැකි ධාතු උභය පද වන අතර එම ධාතුවලින් සකස් කරගන්නා ක්‍රියා උභයපද ලෙස හැඳින්වේ. උදාහරණයක් ලෙස, උභයපදික වප් "वप् बीजसन्ताने" ධාතුව ගත්කල, ගොවියෙකු තමන් සඳහා ම කෙත වපුරයි නම් (वपते) යනුවෙන් ද ඔහු වැපිරීම කරන්නේ වෙනත් අයෙකුගේ ප්‍රයෝජනයක් සඳහා නම් (वपति) යනුවෙන් ද යෙදෙයි.

**විවිධ පදයන්ගේ අවශ්‍යතාව**

පදාර්ථය නිශ්චිතව ම ප්‍රකාශ කිරීමේ අවශ්‍යතාව මත මෙම ප්‍රභේද ගොඩනැගී ඇත. එනම් ක්‍රියාවෙහි ඵලය හිමිවන්නේ කාහට ද? යන්න නිශ්චිතව ම ප්‍රකාශ කිරීමේ අවශ්‍යතාව මත මෙම වර්ගීකරණය නිර්මාණය වී ඇත. මෙය සංස්කෘත භාෂාවේ දියුණුව ප්‍රකාශ වන්නකි. පශ්චාත් කාලීන ව මෙම වෙනස නොසලකා සියලු ම ආකාරයේ ක්‍රියා පද එකිනෙකට හුවමාරු කර ගැනීමකට යොමු වූ බවක් පෙනෙයි.

**අධ්‍යයනයේ වැදගත්කම**

මෙම අධ්‍යයනයේ ප්‍රයත්නය පාණිනී ආචාර්යවරයා ඉදිරිපත් කළ ආත්මනේපදයේ වරනැගිය හැකි ධාතු පිළිබඳ විමර්ශනය කිරීම යි. අෂ්ටාධ්‍යායීහි 1.3.12 සිට 1.3.77 දක්වා සූත්‍රවලින් ඉදිරිපත් කෙරෙන කරුණු මෙහි දී සලකා බැලේ. ඒ අනුව ආත්මනේපද ප්‍රත්‍ය භාවිතයෙන් ක්‍රියා පද නිර්මාණය කර ගත හැකි ධාතු පිළිබඳ විවරණයක් මෙයින් සිදු වේ. වර්තමානය වන විට සංස්කෘත හා සම්බන්ධ විද්‍යාර්ථීන් ගැඹුරු අධ්‍යයනවලට නොගොස් ක්‍රියාපද භාවිතය පිළිබඳ මඳ දැනුමකින් යුක්ත වන බැවින් එබඳු විද්‍යාර්ථීන්ගේ දැනුම වර්ධනය සඳහා මෙම අධ්‍යයනය වැදගත් වනු ඇත.

**පර්යේෂණ ගැටලුව**

පාණිනී ආචාර්යවරයා විසින් අෂ්ටාධ්‍යායී සූත්‍රවල දක්වන ආත්මනේපදයේ භාවිතය

පිළිබඳ නිර්දේශ කෙබඳු ද?, එම නිර්දේශ කාශිකාවෘත්තිකරු විසින් විවරණය කරන්නේ කෙසේ ද? යන්න මෙහි පර්යේෂණ ගැටලු වේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙහි දී උපයෝගි කර ගැනෙනුයේ ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශය යි. ඒ අනුව ආත්මනේපද භාවිතයට අදාළ සූත්‍ර සාකච්ඡා කිරීම සිදු කෙරෙන අතර ග්‍රන්ථ විශ්ලේෂණ ක්‍රමය අනුගමනය කරමින් කාශිකාවෘත්ති අධ්‍යයනයෙන් සූත්‍ර විවරණය කිරීමක් මෙහි දී සිදු වේ. ඒ අනුව මූලික ව ම අෂ්ටාධ්‍යායී සූත්‍රය දක්වන අතර ඒ සමඟ ම එම සූත්‍රය පිළිබඳ සාකච්ඡාවක් කෙරෙයි. ඒ අදාළ සූත්‍රය සඳහා කාශිකා වෘත්ති සලකා බැලීමෙනි. ඒ සමඟ අදාළ නිදසුන් පිළිබඳ සලකා බැලීමක් සිදු කෙරෙයි.

**සාකච්ඡාව**

**සූත්‍රය 1.3.12**

**අනුදාත්තඞිත ආත්මනේපදම්**

අනුදාත්ත ස්වර හා ඞ් සහිත ධාතුන්ට ආත්මනේපද ප්‍රත්‍ය යෙදෙයි.

පොදු තත්වය නම් ධාතුවෙන් පරව තිඞ් ප්‍රත්‍ය යෙදීම යි. එහෙත් මෙම සූත්‍රයෙන් විශේෂ නියමයක් ඉදිරිපත් කෙරෙයි. එනම් අනුදාත්ත ස්වරයෙන් පර ව හා ඞ් (ඞ්) වර්ණයෙන් පරව ආත්මනේපද ප්‍රත්‍ය යෙදෙන බව යි. සෙසු ප්‍රත්‍ය නොයෙදෙයි.[1]

උදා ඃ ආස්තේ ආසාතේ ආසන්තෙ (මෙහි අනුදාත්ත ස්වරය ‘ආ’ ය.)

ශෙතේ ශයාතේ ශේරතේ (ශීඞ් ධාතුවේ ඞ් ඉවත් වේ.)

**සූත්‍රය 1.3.13**

**භාවකර්මණොඃ**

භාවාර්ථයෙහි ද කර්මකාරකාර්ථයෙහි ද ආත්මනේපද ප්‍රත්‍ය යෙදෙයි.[2] මෙහි ‘ච’ යන්නෙන් කර්තෘ කාරකයෙහි ද යෙදෙන බව අදහස් වේ.

සකර්මක ධාතුන් කෙරෙන් කර්ම කාරකයෙහි දේවදත්තෙන ගටඃ ක්‍රීයතෙ කර්තෘ කාරකයෙහි කෙදාරඃ (ස්වයමේව) ලූයතෙ අකර්මක ධාතුන් කෙරෙන් භාව කාරකයෙහි භවතා ග්ලායතේ / භවතා සුප්‍යතෙ

**සූත්‍රය 1.3.14**

**කර්තරි කර්මව්‍යතිහාරේ**

ක්‍රියා ව්‍යතිහාරාර්ථයෙහි කර්තෘකාරකයෙහි ද ආත්මනේපද ප්‍රත්‍ය යෙදෙයි.[3] මෙහි කර්ම ශබ්දය ක්‍රියවාචී වේ. ව්‍යතිහාර නම් හුවමාරු හෙවත් විනිමය අර්ථය යි. යම් තැනක එක් අයෙකුට අදාළ කාර්යයක් තවත් අයෙක් කරයි ද, අනෙකෙකුට සම්බන්ධ ක්‍රියාවක් වෙනත් අයෙක් කරයි ද ඒ කර්මව්‍යතීහාර නම්. එනම් ව්‍යතිහාර ක්‍රියාවකි.[4]

ව්‍යතීහාර දෙකකි.

1. එකෙකුගේ කාර්යයක් අනෙකෙක් කරයි නම් එය ව්‍යතීහාර නම් වේ.

නිදසුනක් ලෙස ගස් කැපීම ශුද්‍රයන්ට අයත් කාර්යයකි. නමුත් බ්‍රාහ්මණයෙකු කරයි නම් එය ව්‍යතීහාරයකි. එවිට ආත්මනේපදය භාවිත වේ.

බ්‍රාහ්මණඃ වෘක්‍ෂං ව්‍යතිලුනීතේ (බමුණා වෘක්‍ෂය සිඳී)

2. දෙදෙනෙක් (අන්‍යොන්‍යව) ක්‍රියාව හුවමාරු කර ගනී නම් එය ද ව්‍යතිහාර නම් වේ. නිදසුනක් ලෙස රජවරු දෙදෙනෙක් පහර දී ගනිත් නම් එය ව්‍යතිහාරයකි. එවිට ද ආත්මනේපදය භාවිත වේ.

රාජානෞ සම්ප්‍රහරේතේ (රජවරු දෙදෙන (ඔවුනොවුන්ට) පහර දෙත්.)

මේ අනුව කර්තෘ කාරක වාක්‍ය වුව ද ව්‍යතිහාර අර්ථ ගම්‍ය වේ නම් ආත්ම නේපද ප්‍රත්‍ය භාවිත වේ.

**සූත්‍රය 1.3.15**

**න ගතිහිංසාර්ථෙභ්‍යඃ**

ගමනාර්ථයෙහි හා හිංසාර්ථයෙහි ධාතුන් කෙරෙන් වන කර්තෘ කාරක වාක්‍යක් කර්ම ව්‍යතිහාරාර්ථයෙහි වුව ද ආත්ම නේපද නො වේ.[5]

උදා :- වනිතාඃ ව්‍යතිගච්ඡන්ති (කාන්තාවෝ (ඔවුනොවුන්ගේ ගෘහයන්ට) යාම් ඊම් කරති.)

චොරෞ (සරස්පරං) ව්‍යතිහිංසන්ති (සොරු දෙදෙනා පහරදීගනිත්.)

**සූත්‍රය 1.3.16**

**ඉතරෙතරාන්‍යොන්‍යපපදාච්ච**

කර්ම ව්‍යතිහාරාර්ථයෙහි වුව ද ඉතරේතර, අන්‍යෝන්‍ය පදවලින් පසු ව ඇති ධාතුව ආත්මනේපද නො වේ.[6]

උදා :- ඉතරේතරස්‍ය සස්‍යං ව්‍යතිලුනන්ති.

අන්‍යොන්‍යස්‍ය සස්‍යං ව්‍යතිලුනන්ති.

**සූත්‍රය 1.3.17**

**නෙර්විශඃ**

නි පූර්ව විශ් ධාතුවට ආත්මනේපද වේ.[7] සාමාන්‍යයෙන් විශ් ධාතුව පරස්මෛපද ධාතුවක් වුව ද නි පූර්ව වීමෙන් පසු ආත්මනේපද යෙදෙන බව මෙයින් ප්‍රකාශ වේ.

උදා :- නිවිශතේ නිවිශේතේ නිවිශන්තේ

**සූත්‍රය 1.3.18**

**පරිව්‍යවේභ්‍යඃ ක්‍රියඃ**

පරි, වි, අව යන උපසර්ග පූර්ව වූ ක්‍රී ධාතුව ආත්මනේපද ප්‍රත්‍ය වේ.[8]

උදා:- පරික්‍රීණීතේ, වික්‍රීණීතේ, අවක්‍රීණීතේ

**සූත්‍රය 1.3.19**

**විපරාභ්‍යාම් ජේඃ**

වි සහ පර උපසර්ගවලින් යුක්ත ජී ධාතුව ආත්මනේපද වේ.[9]

උදා :- විජයතේ, පරාජයතේ

**සූත්‍රය 1.3.20**

**ආඞො දෝ(අ)නාස්‍යවිහරණේ**

ආ පූර්ව දා ධාතුවට මුඛය විවෘත කිරීම් අර්ථයෙහි හැර සෙසු අර්ථයන්හි දී ආත්මනේපද වේ.[10]

උදා :- විද්‍යාමාදත්තෙ සඃ (ඔහු දැනුම ඎ ස්කරගනී)

මුව විවෘත කිරීම්/වීම් අර්ථයන්හි ආත්මනේපද නො වේ.

උදා :- ආස්‍යං ව්‍යාදදාති (ඔහු මුව විවෘත කරයි.)

ක්‍රියාව කරන්නාගේ මුව විවෘත කිරීම්වලට සමාන අර්ථයන්හි ද ආත්මනේපද නො වේ.[11]

උදා :- කූලං ව්‍යාදදාති නදී (ගංගාව ඉවුරු බිඳී.)

එහෙත් ක්‍රියාව කරන්නාගේ ශරීරයට අයත් නොවන කල්හි ක්‍රියා පදය ආත්මනේපද වේ.[12]

උදා :- ව්‍යාදදතේපිපීලිකාඃ පතංගස්‍ය මුඛම් (කුහුඹුවෝ පළගැටියාගේ මුව විවෘත කරත්.)

**සූත්‍රය 1.3.21**

**ක්‍රීඩෝ(අ)නුසම්පරිභ්‍යශ්ච**

ක්‍රීඩ් ධාතුව පරස්මෛපද වන නමුත් ආ, අනු, සම්, පරි උපසර්ග ක්‍රීඩ් ධාතුව සමඟ එක් වූ විට ආත්මනේපද ප්‍රත්‍ය ගනී. මෙහි ච නිපාතයෙන් අ උපසර්ගය ඇඟවෙන බව පෙනෙයි.[13]

උදා :- අනුක්‍රීඩතෙ/සංක්‍රීඩතෙ/පරික්‍රීඩ-තෙ/ ආක්‍රීඩතෙ

එහෙත් ක්‍රීඩ් ධාතුව ශබ්ද නිපදවීමේ අර්ථයෙන් යෙදෙන කල මෙලෙස ආත්මනේපදය නොගනී.

උදා :- සංක්‍රීඩන්ති ශකටානි

කර්මප්‍රවචනීයාර්ථයෙහි ද ක්‍රීඩ් ධාතුව ආත්මනේපද නොගනී.

උදා :- සඃ මානවකමනුක්‍රීඩති. (ඔහු ළමයා අනුව ක්‍රීඩා කරයි.)

මෙම සූත්‍රය හා සම්බන්ධ වාර්තිකා කීපයක් දැක්වේ. ඒ පහත ආකාරයෙනි.

1. ක්‍රීඩ් ධාතුව සම් උපසර්ගය පූර්ව වූ කල පරස්මෛපදයෙහි පමණක් වරනැඟේ.

උදා :- ශකටම් සංක්‍රීඩති. (කරත්තය හඬ නංවයි.)

2. අපේක්‍ෂාවෙන් කල් ගෙවීම් අර්ථයන් හිදී ආ පූර්ව ගම් ධාතුව ණිච් (ය) ධාතුව ආත්මනේපද ගනී.[14]

උදා :- ආගමයස්ව තාවන්මානවකමං (දරුවා පිළිබඳ අපේක්‍ෂාවෙන් කල් ගෙවන්න.)

3. ශික්ෂ් ධාතුව විමසීම්/විචාරණ අර්ථයේදී ආත්මනේපද ගනී.[15]

උදා :- සඃ විද්‍යාසු ශික්‍ෂතෙ (ඔහු විද්‍යාවන්හි විමසීම් කරයි.)

4. ආශීර්වාද කිරීම් අර්ථයේදී නාථ් ධාතුව ආත්මනේපද ගනී[16] ධාතුපාඨයේ මෙම ධාතුව ආත්මනේපද බව සඳහන් වුව ද මෙම අර්ථයේදී පමණක් ආත්මනේපද වේ. වෙනත් අර්ථයන්හි පරස්මෛපද වේ.

උදා :- සඃ සර්පිෂො නාථතෙ (ගිතෙලින් ආශිර්වාද කරයි.)

5. හරති යන්න අනුකරණාර්ථයෙහි ආත්මනේපද ගනී.[17]

උදා :- පෛතෘකමශ්වා අනුහරන්තෙ (අශ්වපැටව් පියාගේ ස්වභාවය ගනිත්.)

6. කෘෘ ධාතුව මෝදන (සතුටු වීම්) භෝජන (ආහාර ගැනීම්) ආශ්‍රය (ආශ්‍රය කිරීම්) අර්ථයන්හි දී ආත්මනේපද ගනී.[18]

උදා :- හෘෂ්ටඃ වෘෂඃ අපස්කිර්යතේ (සතුටින් සිටින වෘෂභයා පාදයෙන් පොළොව හෑරීම් අර්ථයෙනි.)

අපස්කිර්යතේ කුක්කුටෝ භක්ෂාර්ථී (කෑම සොයනු කැමැත්තෙන් කුකුළා බිම සාරයි.)

කුක්කුරඃ අපස්කීර්යතෙ (බල්ලා නිදාගැනීම සඳහා බිම සෑරීම් අර්ථයෙනි.)

7. ආඞ් පූර්ව නු (ස්තුති කිරීම්) සහ ප්‍රච්ඡ් (විමසීමේ) ධාතු ආත්මනෙ පද ගනී.[19]

උදා :- ආනුතේ ශෘගාලඃ (සිවලා උඩුබුරයි.)

ඡාත්‍රඃ ආපෘච්ඡතේ ගුරුම් (ශිෂ්‍යයා ගුරුවරයාගෙන් විමසයි.)

8. ශප් (ශාප කිරීමේ) ධාතුව උභයපද වේ. උපලම්භන අර්ථයේ දී ශප් ධාතුව ආත්මනේපද ගනී. උපලම්භන නම් වචනයෙන් ශරීරය ස්පර්ශ කිරීමයි.[20]

උදා :- දේවදත්තාය ශපතේ (දේවදත්තට ශාප කරයි.)

**සූත්‍රය 1.3.22**

**සමවප්‍රවිභ්‍යඃ ස්ථඃ**

සම්, අව, ප්‍ර, වි උපසර්ග සමඟ වූ ස්ථා ධාතුවට ආත්මනේපද ප්‍රත්‍ය වේ.[21]

උදා :- සම්තිෂ්ඨතේ/අවතිෂ්ඨතේ/ප්‍රතිෂ්ඨතෙ/විතිෂ්ඨතේ.

ආ පූර්ව ස්ථා ධාතුව ප්‍රතිඥා අර්ථයෙහි ආත්මනේපද වේ.[22]

උදා :- ශබ්දං ආතිෂ්ඨයේ'හම් (මම වචන යට අනුව කටයුතු කරමි.)

**සූත්‍රය 1.3.23**

**ප්‍රකාශනස්ථේයාඛ්‍යයෝශ්ච**

ප්‍රකාශනයෙහි හා විවාද සමාප්ත කිරීමෙහි අර්ථයන්හි ස්ථා ධාතුව ආත්මනේපද ගනී.[23] මෙහි ප්‍රකාශන යනු තම මතය පැහැදිලි කිරීම යි.

උදා :- (ප්‍රකාශනයෙහි) තිෂ්ඨතෙ ජායා පත්‍යෙ (බිරිඳ ස්වාමියාට (තමා පිළිබඳ) ප්‍රකාශ කරයි.)

ත්වයිතිෂ්ඨතේ (තීරණය ඔබගෙන් අපේක්‍ෂා කෙරේ.)

**සූත්‍රය 1.3.24**

**උදෝ(අ)නූර්ද්ධවකර්මණි**

උත් උපසර්ගය ස්ථා ධාතුව හා එක් වූ විට ඉහළ නැඟීමේ හෝ නැඟී සිටීමේ අර්ථයෙහි නො වේ නම් ආත්මනේපද ප්‍රත්‍ය ගනී. උත්සාහය, වෙහෙසීම, ආධ්‍යාශය ආදි අර්ථයන්හි වේ.[24]

උදා :- සඃ ගෘහෙ උත්තිෂ්ඨතෙ (ඔහු නිවස වෙනුවෙන් වෙහෙසෙයි.)

**සූත්‍රය 1.3.25**

**උපාන්මන්ත්‍රකරණේ**

උප පූර්ව ස්ථා ධාතුව ආත්මනේපද ප්‍රත්‍ය ගත් කල්හි මන්ත්‍රකරන අර්ථයෙහි වේ.[25]

සඃ ඓන්ද්‍රාගාර්හපත්‍යමුපතිෂ්ඨතේ (ඔහු ඓන්ද්‍රවලින් ගාර්හපත්‍යට මන්ත්‍ර ජප කරයි.)

උප පූර්ව ස්ථා ධාතුව පිදීම්, සංසර්ග සඳහා ළංවීම, මිත්‍රත්වය ඇති කර ගැනීම, මාර්ග යන අර්ථයන්හි දී ආත්මනේපද ගනී.[26]

උදා :- සඃ ආදිත්‍යමුපස්තිතේ (ඔහු සූර්යා පුදයි.)

පතිමුපතිෂ්ඨතේ නාරී (බිරිඳ ස්වාමියා වෙත පැමිණේ.)

සන්තමුපතිෂ්ඨතෙ සාධුඃ (යහපත් මනිසා සාන්තුවරයා වෙත ළඟා වේ.)

අයං පන්ථා සෘඝ්නමුපතිෂ්ඨතේ (මේ මාර්ගය සෘග්නයට වේ.)

වෙත එළඹීම ප්‍රකාශ කෙරෙන විට ආත්මනේපද බවට පත්වීම විකල්පයෙන් වේ.

යාචකෝ බ්‍රාහ්මණකුලම් උපතිෂ්ඨෙත් / උපතිෂ්ඨති (යාචකයා බ්‍රාහ්මණ ගෘහයට එළඹේ.)

**සූත්‍රය 1.3.26**

**අකර්මකාච්ච**

උප පූර්ව ස්ථා ධාතුව අකර්මක ප්‍රයෝග යන්හි දී ආත්මනේපද ගනී.[27]

උදා :- යාවද් ඕදනම් උපතිෂ්ඨතේ (ආහාර කාලයෙහි සමීපයෙහි සිටී.)

මෙය සකර්මක වේ නම් පරස්මෛපද වේ.

උදා :- යාවද් ඔදනම් රාජානං උපතිෂ්ඨති (ආහාර කාලයේ රජු සමීපයේ සිටී.)

**සූත්‍රය 1.3.27**

**උද්විභ්‍යාං තපඃ**

උත්, වි යන උපරසර්ගවලින් එකක් පූර්ව කොට ඇති තප් ධාතුව අකර්මක භාවිතයේ දී ආත්මනේපද ගනී.[28]

උදා :- විතපතේ විද්‍යායා විද්‍යාර්ථී (විද්‍යාර්ථීයා දැනුමෙන් බබළයි.)

සකර්මක භාවිතයේ දී පරස්මෛපද වේ.

උදා :- උත්තපති සුවර්ණං සුවර්ණකාරඃ (රන්කරු රන් තවයි.)

නමුත් සකර්මක භාවිතයේ කර්මය කර්තෘගේ ශරීරය සම්බන්ධ දෙයක් වේ නම් එවිට ආත්මනේපද වේ.

උදා :- සඃ සවස්‍ය හස්තං උත්තපතේ. (ඔහු තම අත තවයි.)

**සූත්‍රය 1.3.28**

**ආඞෝ යමහනඃ**

ආ උපසර්ගය යම් හෝ හන් ධාතු සමඟ වන විට අකර්මක ප්‍රයෝගයන්හි දී ආත්මනේපද ප්‍රත්‍ය ගනී. සකර්මක නම් පරස්මෛපද වේ.[29]

උදා :- ආයච්ඡතේ, ආයච්ඡේතේ, ආයච්චන්තෙ.

ආහතෙ, ආඝ්නාතෙ, ආඝ්නතේ.

සකර්මක නම් පරස්මෛපදයෙහි යෙදෙයි.

උදා :- ආයච්ඡති කූපාද් රජ්ජුම්.

එහෙත් සකර්මක භාවිතයේ කර්මය කර්තෘගේ ශරීරය සම්බන්ධ දෙයක් වේ නම් එවිට ආත්මනේපද වේ.[30]

උදා :- සඃ ආයච්ඡතේ පාණිම්/ සඃ ආහතේ ශිරඃ.

**සූත්‍රය 1.3.29**

**සමෝ ගම්‍යෘච්ඡිප්‍රච්ඡිස්වරත්‍යර්තිශ්‍රුවි දිභ්‍යඃ**

සම් උපසර්ගය සමඟ වූ ගම්, ඍච්, ප්‍රච්, ස්වර්, ඍ, ශ්‍රැ, විද් යන ධාතු අකර්මක භාවිතයේ දී ආත්මනේපද ප්‍රත්‍ය ගනී.[31]

උදා :- සංගච්ඡතේ./ සමෘච්ඡතේ./ සංපෘච්ඡතේ./ සංස්වරතේ./ සමෘච්ඡතේ (ඍ ධාතුව ඍච්ඡ වේ)/ සංශෘණුතේ./ සංවිත්තේ.

මෙම ප්‍රයෝගයේ දී දෘශ් ධාතුව අකර්මක භාවිතයේ දී ආත්මනේපද ගනී.[32]

උදා :- සඃ සංපශ්‍යතේ. (ඔහු කල්පනා කරයි/ නිරීක්‍ෂණය කරයි.)

**සූත්‍රය 1.3.30**

**නිසමුපවිභ්‍යෝ හ්වඃ**

නි, සම්, උප, වි උපසර්ග හ්වේ ධාතුව සමඟ එක් වූ කල්හි ක්‍රියාවේ ඵලය කර්තෘට නොලැබුණ ද ආත්මනේපද ප්‍රත්‍ය ගනී.[33]

උදා :- නිහ්වයතේ, සංහ්වයතෙ, උපහ්වයතෙ, විහ්වයතෙ.

අස් සහ ඌහ් ධාතු උක්ත උපසර්ග සමඟ යෙදෙන විට විකල්පයෙන් ආත්මනේපද ප්‍රත්‍ය ගනී. ඒ අනුව නිරස්‍යති ලෙස ද නිරස්‍යතේ ලෙස ද වේ. සමූහති වශයෙන් ද සමූහතේ වශයෙන් ද වේ.

**සූත්‍රය 1.3.31**

**ස්පර්ද්ධායාමාඞඃ**

ආ උපසර්ගය හ්වේ ධාතුව සමඟ වූ විට තරග කිරීම් අර්ථයෙන් ආත්මනේපද ප්‍රත්‍ය ගනී.34

උදා :- මල්ලො මල්මාහ්වයතෙ.

**සූත්‍රය 1.3.32**

**ගන්ධනාවක්ෂේපණසේවනසාහසික්‍යප්‍රතිය ත්නප්‍රකථනෝපයෝගේෂු කෘඤඃ**

කෘ ධාතුව ගන්ධන, (කේලම් කීමෙහි) අවක්ෂේපණ, (නින්දා කිරීමෙහි) සේවන, (සේවනයෙහි) සාහසික්‍ය, (බලාත්කාරකමෙහි) ප්‍රතියත්න, (වෙනත් ගුණයක් ගැනීම) ප්‍රකථන, (කථන) උපයෝග (භාවිතය) යන අර්ථයන්හි දී ආත්මනේපද ගනී. සෙසු අර්ථයන්හි දී උභයපද ගනී.[35]

උදා :- සඃ තානසෙනමුත්කුරුතේ (ඔහු තානසෙන පිළිබඳ කේලම් කියයි.)

රාජා ශත්‍රැමුදාකුරුතෙ (රජු සතුරාට නින්දා කරයි.)

**සූත්‍රය 1.3.33**

**අධෙඃ ප්‍රසහනේ**

අභිබවනාර්ථ අධි පූර්ව කෘ ධාතුවට ආත්මනේපද වේ.[36]

උදා :- රාජා ශත්‍රුං අධිකුරුතෙ (රජු සතුරා පරදවයි.)

**සූත්‍රය 1.3.34**

**වේඃ ශබ්දකර්ම්මණඃ**

වි පූර්ව කෘ ධාතුව ආත්මනේපද ගන්නා අතර ශබ්ද කිරීම්, උච්චාරණය කිරීම් අර්ථයන්හි වේ.[37]

උදා :- සඃ විකුරුතෙ ස්වරාන් (ඔහු ස්වර උච්චාරණය කරයි.)

**සූත්‍රය 1.3.35**

**අකර්මකාච්ච**

වි පූර්ව කෘ ධාතුව අකර්මක වාක්‍යන්හි දී ආත්මනේපද ප්‍රත්‍ය ගනී.[38]

උදා :- විකුර්වන්තෙ සෛන්ධවාඃ (අශ්වයෝ මැනවින් ගමන් කරත්.)

**සූත්‍රය 1.3.36**

**සම්මානනෝත්සඞ්ජනාචාර්යකරණ ඥානභෘතිවිගණනව්‍යයේෂු නියඃ**

සම්මාන, (යහපත් මාර්ග දර්ශන අර්ථයෙහි) උත්සඞ්ජන, (ඉහළ නැංවීම් අර්ථයෙහි) ආචාර්යකරණ, (විධිමත් ව ඥානය දීම් අර්ථයෙහි) ඥාන, (නිශ්චය කිරීම්/තීරණය කිරීම් අර්ථයෙහි) භෘති, (සේවයෙහි යෙදවීම් අර්ථයෙහි) විගණන, (ණය ගෙවීම් අර්ථයෙහි) ව්‍යය (වැය කිරීම් අර්ථයෙහි) යන අර්ථයන්හිදී නී ධාතුව ආත්මනේපද ප්‍රත්‍ය ගනී.[39]

උදා :- සම්මානන - ආචාර්යඃ ඡාත්‍රං ව්‍යාකරණේ නයතේ.

උත්සඞ්ජන - රාජා දණ්ඩමුන්නයතේ.

ආචාර්යකරණ - මානවකමුපනයතේ.

ඥාන - සඃ තත්වම් නයතේ.

භෘති - ධනිකඃ කර්මකාරමුපනයතේ.

විගණන - මද්‍රාඃ කරං විනයන්තේ.

ව්‍යය - ධනිකඃ ශතං විනයතේ.

සෙසු අර්ථයන්හි උභයපද වේ.

**සූත්‍රය 1.3.37**

**කර්තෘස්ථේ චාශරීරේ කර්මණි**

කර්තෘ තුළ වූ කර්ම පදය සත්ව ශරීරය හෝ අවයවයක් නොවේ නම් පමණක් නී ධාතුව ආත්මනේපද ප්‍රත්‍ය ගනී.[40]

සඃ ක්‍රෝධං විනයතේ (ඔහු ක්‍රෝධය යටපත් කරයි.)

කර්මය කර්තෘ තුළ පැවතිය යුතු වේ. නැතහොත් ක්‍රියාව පරස්මෛපද වේ. ' දේවදත්තො යඥදත්තස්‍ය ක්‍රෝධං විනයති. වශයෙනි. තව ද, කර්මය අද්‍රව්‍යය විය යුතු වේ. නැතහොත් ක්‍රියාව පරස්මෛපද ගනී. 'සඃ ගඩුං විනයති' වශයෙනි. අකර්මක ක්‍රියවක දී ක්‍රියාව පරස්මෛපද වේ. 'ප්‍රඥයා විනයති' වශයෙනි.

**සූත්‍රය 1.3.38**

**වෘත්තිසර්ගතායනේෂු ක්‍රමඃ**

වෘත්ති, (බාධා රහිතව නිරන්තර නිරතවීම්) සර්ග, (උත්සාහ) තායන (විස්තාරණ) අර්ථයන්හි දී ක්‍රම් ධාතුව ආත්මනෙ පද ප්‍රත්‍ය ගනී.[41]

උදා :- වෘත්ති - ඍක්ෂ්වස්‍ය ක්‍රමතේ බුද්ධිඃ (ඔහුගේ බුද්ධිය ඍග් වටහාගනී.)

සර්ග - ඡාත්‍රඃ ව්‍යාකරණාධ්‍යයනාය ක්‍රමතේ (සිසුවා ව්‍යාකරණාධ්‍යයනයෙහි උත්සුක වෙයි.)

තායන - අස්මිනශාස්ත්‍රාණි ක්‍රමන්තේ (මොහු තුළ ශාස්ත්‍ර වැඩෙයි.)

**සූත්‍රය 1.3.39**

**උපපරාභ්‍යාම්**

ක්‍රම් ධාතුව උප, පර උපසර්ග සමඟ වූ විට[42] වෘත්ති, සර්ග, තායනාර්ථයන්හි පමණක් ආත්මනේපද ගනී.

උදා :- උපක්‍රමතේ / පරාක්‍රමතේ

වෙනත් උපසර්ග සමඟ 'සංක්‍රාමති' ආදි වශයෙන් පරස්මෛපද වේ.

**සූත්‍රය 1.3.40**

**ආඞ උද්ගමනේ**

ක්‍රම් ධාතුව ආ උපසර්ගය සමඟ යෙදුන විට ආත්මනේපද ගනිමින් උද්ගමනාර්ථයෙහි වේ.[43] මෙයින් ආලෝකයෙහි උද්ගමනය අර්ථවත් වේ.[44]

උදා :- ආක්‍රමතේ චන්ද්‍රමාඃ (සඳ රැස් උදාවේ.)

එසේ නොවූ කල්හි පරස්මෛපද වේ.

උදා :- ආක්‍රමති ධූමෝ හර්ම්‍යතලාත්

**සූත්‍රය 1.3.41**

**වේඃ පාදවිහරණේ**

ක්‍රම් ධාතුව වි උපසර්ගය පූර්ව කොට යෙදුන කල්හි පාද විහරණ නොහොත් පා තැබීමේ අර්ථයෙන් ආත්මනේපද ප්‍රත්‍ය ගනී.[45]

උදා :- වාජී වික්‍රමතේ (අශ්වයා පා තබයි.)

**සූත්‍රය 1.3.42**

**ප්‍රෝපාභ්‍යාං සමර්ථාභ්‍යාම්**

ප්‍ර, උප යන උපසර්ග ක්‍රම් ධාතුවට වූ කල්හි ප්‍රාරම්භාර්ථයෙහි ආත්මනේපද වේ.[46]

උදා :- ප්‍රක්‍රමතේ භෝක්තුම් (ආහාර පිණිස පිටත් වේ.)

උපක්‍රමතේ භෝක්තුම් (ආහාර පිණිස පිටත් වේ.)

වෙනත් අර්ථයන්හි පරස්මෛපදී වේ.

උදා :- සඃ පූර්වේද්‍යුඃ ප්‍රක්‍රාමති අපරේද්‍යුරුපක්‍රාමති (ඔහු පෙරවරුවේ යයි පස්වර්වේ එයි.)

**සූත්‍රය 1.3.43**

**අනුපසර්ගාද්වා**

පෙර සූත්‍රය හා සම්බන්ධ වේ. එකී ක්‍රම් ධාතුව උපසර්ගවලින් තොර ව යෙදෙන විට විකල්පයෙන් ආත්මනේපද ප්‍රත්‍ය ගනී.[47] ඒ අනුව ක්‍රමතේ ලෙස ද ක්‍රාමති ලෙස ද තැබිය හැකි ය. උපසර්ග සහිත නම් පරස්මෛපද වේ. සංක්‍රාමති ආදි වශයෙනි.

**සූත්‍රය 1.3.44**

**අපහ්නවේ ඥඃ**

ඥා ධාතුව ප්‍රතික්ෂේප කිරීම් අර්ථයෙහි දී ආත්මනේපද වේ.[48] උපසර්ග සහිත ව ම යෙදේ තනිව නොයෙදෙයි.

උදා :- සඃ ශතමපජානීතෙ (ඔහු සියයක ණය ප්‍රතික්ෂේප කරයි.)

**සූත්‍රය 1.3.45**

**අකර්මකාච්ච**

පෙර සූත්‍රය හා සම්බන්ධ වේ. ඥා ධාතුව අකර්මකව යොදන කල්හි ක්‍රියාවේ ඵලය කර්තෘට නොවේ නම් ආත්මනේපද වේ.[49]

උදා :- සඃ සර්පිෂෝ ජානීතේ (ඔහු ගිතෙලින් පුදයි.)

**සූත්‍රය 1.3.46**

**සම්ප්‍රතිභ්‍යාමනාධ්‍යානේ**

සම්, ප්‍රති පූර්ව ඥ ධාතුව සිහිකිරීම් සහ කළකිරීම් අර්ථයන්හි නොයෙදෙන විට ආත්මනේපද ගනී.[50]

උදා :- සඃ ශතං සංජානීතේ (ඔහු සියයක් සොයයි.)

සඃ සහස්‍රං ප්‍රතිජානීතෙ (සියයක් පොරොන්දු වෙයි.)

එකී අර්ථයන්හි පරස්මෛපද වේ. 'මාතුඃ සංජානාති' ආදි වශයෙනි.

**සූත්‍රය 1.3.47**

**භාසනෝපසම්භාෂාඥානයත්න විමත්‍යුපමන්ත්‍රණේෂු වදඃ**

වද් ධාතුව භාසන, (බැබළීම්) උපසම්භාෂා, (සංසිඳුවීම් අර්ථය) ඥාන, (දැනගැනීමෙහි) යත්න, (උත්සාහයෙහි) විමති, (නොයෙක් මත ඇති බවෙහි) උපමන්ත්‍රණ (පොළඹවා ගැනීමෙහි) යන අර්ථයන්හි යෙදෙන විට ආත්මනේපද වේ.[51]

භාසන - වදතෙ චාර්වී ලොකායතෙ (චාර්වී ලෝකායතෙ ශාස්ත්‍රය ආලෝකවත් කරයි.)

උපසම්භාෂා - කර්මකාරානුපවදතේ (කම්කරුවන් සංසිඳුවයි.)

ඥාන - වදතේ චාර්වී ලොකායතේ. (චාර්වී ලෝකායත ශාස්ත්‍රය සම්පූර්ණයෙන් දැනගනී.)

යත්න - සඃ ගේහේ වදතේ (ඔහු ගෙදරදී උත්සාහවත් වෙයි.)

විමති - තෙ ක්ෂේත්‍රෙ විවදන්තෙ (ඔවුහු කුඹුර පිළිබඳ විවාද කරති.)

උපමන්ත්‍රණ - කුලභාර්යාමුපවදතේ (කුල භාර්යාව පොළොඹවා ගනී.)

**සූත්‍රය 1.3.48**

**ව්‍යක්තවාචාං සමුච්චාරණේ**

ව්‍යක්ත වචනයන් මැනවින් උච්චාරණය යන අර්ථය ඇති කල්හි වද් ධාතුව ආත්මනේපද ගනී.[52] ව්‍යක්ත වචනයන් යනුවෙන් කී කල්හි මනුෂ්‍ය භාෂණයන් බව කියවේ.[53]

උදා :- සම්ප්‍රවදන්තෙ බ්‍රාහ්මණාඃ

**සූත්‍රය 1.3.49**

**අනෝරකර්මකාත්**

අනු පූර්ව වද් ධාතුව අකර්මක ප්‍රයෝගයේ දී ව්‍යක්ත වචනයන් මැනවින් උච්චාරණය ඇති කල්හි ආත්මනේපද ගනී.[54] අනුවදතේ ආදි වශයෙනි. එසේ නොවන අවස්ථාවන්හි දී අනුවදති' යනුවෙන් පරස්මෛපද වේ.

**සූත්‍රය 1.3.50**

**විභාෂා විප්‍රලාපේ**

වද් ධාතුව ඔවුනොවුන් වාද කර ගැනීම් අර්ථයෙන් යොදන කල විකල්පයෙන් ආත්මනේ පද වේ.[55]

උදා :- වෛද්‍යාඃ විප්‍රවදන්තෙ/ විප්‍රවදන්ති (එකවර ඔවුනොවුන් විරුද්ධත්වය ප්‍රකාශ කරති.)

සමූහ උච්චාරණයෙහි විකල්ප ප්‍රයෝග නොමැතිව ආත්මනේපදයෙහිම වේ.

උදා :- විප්‍රවදන්තෙ මෞහූර්තාඃ

**සූත්‍රය 1.3.51**

**අවාද්ග්‍රඃ**

අව උපසර්ගය සහිත ගෘ ධාතුවට ආත්මනේපද ප්‍රත්‍ය වේ.[56]

උදා :- අවගිරතේ, අවගිරේතෙ, අවගිරන්තෙ

**සූත්‍රය 1.3.52**

**සමඃ ප්‍රතිඥානෙ**

ගෲ ධාතුව සම් උපසර්ගය සමඟ යෙදුණු විට පොරොන්දුවීම් අර්ථයෙන් ආත්මනෙ පද වේ.[57]

උදා :- සඃ සතං සංගිරතේ (ඔහු සියයක් පොරොන්දු වෙයි.)

**සූත්‍රය 1.3.53**

**උදශ්වරඃ සකර්මකාත්**

උත් පූර්ව චර් ධාතුව සකර්මකව යොදන විට ආත්මනෙ පද වේ.[58]

උදා :- සඃ ගුරුවචනමුච්චරතේ (ඔහු ගුරුවරයාගේ වචන කඩ කරයි.)

අකර්මක නම් පරස්මෛපද ප්‍රත්‍ය යෙදෙයි. භාෂ්පමුච්චරති (වාෂ්ප ඉහළ නගී) ආදි වශයෙනි.

**සූත්‍රය 1.3.54**

**සමස්තෘතීයායුක්තාත්**

සම් පූර්ව චර් ධාතුව තෘතියා විභක්ති පදයක් සමඟ යෙදෙන කල්හි ආත්මනේපද ප්‍රත්‍ය ගනී.[59]

උදා :- සඃ රථෙන සංචරතේ (ඔහු රථයෙන් සංචාරය කරයි.)

**සූත්‍රය 1.3.55**

**දාණශ්ච සා චෙච්චතුර්ථ්‍යර්ථේ**

දා ධාතුව පරස්මෛපදී ය. සම් පූර්ව දා ධාතුව චතුර්ති අර්ථයෙන් තෘතීයා විභක්ති පදයක් සමඟ යෙදුණ කල ආත්මනේපද ප්‍රත්‍ය ගනී.[60]

උදා :- කාමී දාස්‍යා සංප්‍රයච්ඡතේ (කාමුකයා දාසියට දෙයි.)

චතුර්ථී අර්ථ රහිත ව තෘතීයා යෙදුව ද පරස්මෛපද ප්‍රත්‍ය ගනී. 'පාණිනා සම්ප්‍රයච්ඡති' වශයෙනි.

**සූත්‍රය 1.3.56**

**උපාද්‍යමඃ ස්වකරණේ**

උප පූර්ව යම් ධාතුව ස්වීකරණාර්ථයෙහි යෙදෙන විට ආත්මනේපද ප්‍රත්‍ය ගනී. මෙහි අත්කර ගැනීම පමණක් නොව විවාහ කරගැනීම් අර්ථ වේ.[61]

උදා :- සඃ භාර්යාමුපයච්ඡතෙ (ඔහු සිය භාර්යාව විවාහකර ගනී.)

**සූත්‍රය 1.3.57**

**ඥාශ්‍රුස්මෘදෘශාං සනඃ**

ස අන්ත කොට ඇති ඥා, ශ්‍රු, ස්මෘ, දෘශ් යන ධාතු ආත්මනේපද ප්‍රත්‍ය ගනී.[62]

උදා :- සඃ ධර්මං විඥාසතේ (ඔහු ධර්මය දැනගැනීමට කැමති වෙයි.)

සඃ ගුරුං ශුශ්‍රූසතේ (ඔහු ගුරුවරයාට සේවය කරන්නට කැමති වෙයි.)

සඃ නෂ්ටං සුස්මූර්ෂතේ (ඔහු අහිමි වූ දෑ ගැන සිහි කරන්නට කැමති වෙයි.)

සඃ නෘපං දිදෘක්ෂතේ. (ඔහු රජු දකින්නට කැමති වෙයි.)

**සූත්‍රය 1.3.58**

**නානෝර්ඥඃ**

පෙර කී (1.3.57) සූත්‍රය හා සම්බන්ධ වේ. එකී ස අන්ත කොට ඇති ඥා ධාතුව අනු උපසර්ගය සමඟ යෙදුණ කල ආත්මනේපද නොවන බව මෙයින් කියවේ.[63] සකර්මක අවස්ථාවන්හි එම ප්‍රතිෂේධය වන බව ද තව දුරටත් කාශිකාව කියයි.[64]

උදා :- සඃ පුත්‍රමනුජිඥාසති (ඔහු දරුවා ගැන විමසයි.)

**සූත්‍රය 1.3.59**

**ප්‍රත්‍යාඞ්භ්‍යාං ශ්‍රුවඃ**

(1.3.57) සූත්‍රය හා සම්බන්ධ වේ. එහි දී ස අන්ත වීමෙන් ආත්මනේපද වූ ශ්‍රු ධාතුව ප්‍රති සහ ආ උපසර්ග සමඟ යෙදීමේදී ආත්මනේපද නොවන බව මින් කියවේ.[65] 'ප්‍රතිශුශ්‍රෑෂති, ආශුශ්‍රෑෂති' ආදි වශයෙනි.

**සූත්‍රය 1.3.60**

**ශදේඃ ශිතඃ**

ශද් ධාතුවෙන් පසු ව ශ් (ශිද්) එක් වී නම් ආත්මනේපද ප්‍රත්‍යය යෙදෙයි. ශද් ධාතුව ශ් හා එක් වීමෙන් ශීය බවට පත් වේ. පසු ව ආත්මනේපද ප්‍රත්‍ය ගැනේ.[66]

උදා :- ශීයතේ ශීයේතේ ශීයන්තේ ආදි වශයෙනි.

**සූත්‍රය 1.3.61**

**ම්‍රියතේර්ලුඞ්ලිඞෝශ්ච**

මෘ (මෘඞ්) ධාතුව ශ අන්ත කොට ඇති කල්හි ලුඞ් හා ලිඞ් ලකාර ප්‍රත්‍ය ගන්නා කල්හි ආත්මනේපද වේ.[67]

උදා :- (ලුඞ්) මෘත අමෘෂාතාම් අමෘෂත

(ලිඞ්) මෘෂීෂ්ට මෘෂීයාස්තාම් මෘෂීරන්

මෘ (මෘඞ්) ධාතුව ඞ් අන්ත කොට ඇති බැවින් 1.3.12 සූත්‍රයට අනුව ආත්මනේපද වේ. එහෙත් මෙහි විශේෂත්වය නම් ශ අන්ත කොට ඇති කල්හි ලුඞ් හා ලිඞ් ලකාරවල දී පමණක් ආත්මනේපද ප්‍රත්‍ය ගන්නා බව යි.[68]

**සූත්‍රය 1.3.62**

**පූර්වවත් සනඃ**

සන් අන්ත වීමට පෙර ප්‍රාථමික අවස්ථාවේ දී ම ආත්මනේ පදී වූ ධාතුවක් සන් අන්ත වීමෙන් පසු ද ආත්මනේපදයෙහි වේ. ඒ අනුව 1.3.12 සූත්‍රයෙන් දැක් වූ ලක්ෂණ සහිත ධාතු සන් අන්ත වීමෙන් පසු ද ආත්මනේපදයෙහි වරනැඟීම වෙනසක් නොවන බව මින් කියවේ.[69] නිදසුන් ලෙස 'ආස්තේ (හිඳී) ශෙතේ (නිදයි) යනුවෙන් ආත්මනේපදයෙහි වර නැඟෙන ධාතු අභිලාෂාර්ථ ස අන්ත වූ කල්හි ද ආත්මනේපදයෙහි යෙදෙයි.

උදා :- ආසිසිෂතේ ආසිසිෂේතේ ආසිසිෂන්තේ (ඉඳගැනීමට කැමති වීමෙහි)

ශිශයිෂතේ ශිශයිෂේතේ ශිශයිෂන්තේ (නිදාගැනීමට කැමති වීමෙහි)

**සූත්‍රය 1.3.63**

**ආම්ප්‍රත්‍යයවත් කෘඤෝ(අ)නුප්‍රයෝගස්‍ය**

ධාතුවකින් පසුව ආම් ප්‍රත්‍යය යෙදී අනතුරුව කෘ ධාතුව හා එක් වූ කල කෘ ධාතුව (අනුප්‍රයෝගය) එකී මුල් ධාතුවේ පදය ගනී. ඒ අනුව මූල් ධාතුව ආත්මනේපද නම් පමණක් කෘ ආත්මනේපද ගනී. මුල් ධාතුව පරස්මෛපද නම් කෘ පරස්මෛපද ද වේ.[70]

ලිට් ලකාරයේ දී ධාතුවකින් පරව ආම් ප්‍රත්‍ය යෙදී අනතුරුව කෘ, භූ, ආස් යන ධාතු මේවායේ ලිට් ලකාරාගත උචිත ස්වරූපය ගනී. මේවායින් භූ සහ අස් ධාතු පරස්මෛපදී වේ. එබැවින් ඒවා එකී එක් වීමෙන් පසු ව ද නිත්‍යයෙන් ම පරස්මෛපදී වේ. එහෙත් කෘ ධාතුව උභයපද වේ. එහෙයින් කුමන පදයක් අනුව වරනැඟිය යුතු දැයි ප්‍රශ්නයක් මතු වේ. මෙම සූත්‍රයෙන් එම ප්‍රශ්නයට පිළිතුරු ලැබේ. මෙහි දී කෘ ධාතුව මුල් ධාතුවේ ආකාරය ගනී. ඒ අනුව මූල් ධාතුව ආත්මනේපද නම් කෘ ආත්මනේපද ගනී. මුල් ධාතුව පරස්මෛපද නම් කෘ පරස්මෛපද ද වේ. මුල් ධාතුව උභයපද නම් ක්‍රියා ඵලය කර්තෘගාමී නම් කෘ ධාතුව ආත්මනේපද වේ. අන් අවස්ථාවන්හි දී පරස්මෛපද වේ.

උදා ඃ- ඒධි (ආත්මනෙපද ධාතුවකි) + ආම් + චක්‍රෙ = ඒධාඤ්චක්‍රෙ

ඉද් (පරස්මෛපද ධාතුවකි) + ආම් + චකාර = ඉන්දාඤ්චකාර

**සූත්‍රය 1.3.64**

**ප්‍රෝපාභ්‍යාං යුජේරයඥපාත්‍රේෂු**

ක්‍රියාවෙහි ඵලය කර්තෘට නොමැති විට පවා යඥ භාජන සම්බන්ධයෙන් හැර ප්‍ර සහ උප පූර්ව යුජ් ධාතුවට ආත්මනේපද ප්‍රත්‍ය යෙදෙයි.[71]

උදා ඃ- සඃ ප්‍රයුක්තේ (ඔහු (ක්‍රියාවෙහි) යෙදෙයි.)

සඃ උපයුක්තෙ (ඔහු භාවිත කරයි.)

යාග සම්බන්ධයකදී පරස්මෛපද වේ. 'යඥී පාත්‍රාණි ප්‍රයුනක්ති' වශයෙනි.

**සූත්‍රය 1.3.65**

**සමඃ ක්ෂ්ණුවඃ**

ක්ෂ්ණු ධාතුව පරස්මෛපදීය වේ. නමුත් සම් පූර්ව ක්ෂ්ණු ධාතුවෙන් පසු ව ආත්මනේපද ප්‍රත්‍ය වේ.[72]

උදා ඃ- සඃ සංක්ෂ්ණුතේ ශස්ත්‍රම්. (ඔහු ආයුධය මුවහත් කරයි.)

**සූත්‍රය 1.3.66**

**භුජෝ(අ)නවනේ.**

පාලනය කිරීම්, ආරක්ෂා කිරීම් අර්ථයෙහි හැර භුජ් ධාතුව ආත්මනෙ පද ගනී.[73] පෝෂණය කිරීමෙහි, ආරක්ෂා කිරීමෙහි, පාලනය කිරීමෙහි, අනුභව කිරීමෙහි ආදි වශයෙන් මෙම ධාතුව අර්ථ කිහිපයක යෙදෙයි.

උදා ඃ- සඃ භුනක්තෙ (ඔහු අනුභව කිරයි.)

**සූත්‍රය 1.3.67**

**ණේරණෞ යත් කර්ම ණෞ චේත් ස කර්තා(අ)නාධ්‍යානේ**

ධාතුවක් ප්‍රයෝජ්‍ය ක්‍රියා වාචක ණි ගෙන් අවසන් වේ නම්, කර්මය ප්‍රයෝජ්‍ය ක්‍රියා අර්ථය නැතිව කර්තෘ ක්‍රියාවේ හේතු කාරකයා වූ කල්හි සහ පසු තැවීමෙන් සිහිකිරීමක් අර්ථවත් නොවන කල්හි, ක්‍රියාවේ ඵලය කර්තෘට නොමැති විට පවා ක්‍රියාව ආත්මනේපද වේ.[74]

උදා ඃ- දෘෂ්‍යතෙ රාජා ස්වයමේව (රජු තමා විසින්ම දකිනු ලැබේ.)

**සූත්‍රය 1.3.68**

**භීස්මෝර්හේතුභයේ**

ප්‍රයෝජ්‍ය වාචක ණි අන්ත කොට ඇති භී සහ ස්මි ධාතු ප්‍රයෝජ්‍ය ක්‍රියා වාචකයන්ගෙන් පසුව ඵලය කර්තෘට නොපැමිණිය ද, බය ප්‍රයෝජ්‍යක කර්තෘ විසින් සම්පාදනය කර තිබෙන කල්හි ආත්මනේපද ප්‍රත්‍ය වේ.[75]

උදා ඃ- ජටිලෝ භීෂයතේ. / මුණ්ඩෝ භීෂයතේ.

**සූත්‍රය 1.3.69**

**ගෘධිවඤ්චෝඃ ප්‍රලම්භනේ**

ගෘධ් සහ වඤ්ච් යන ධාතු මුලා කිරීම් අර්ථයෙන් යුක්තව ප්‍රයෝජ්‍ය ක්‍රියා වාචක ණි අන්ත කොට ඇති කල්හි ක්‍රියාවේ ඵලය කර්තෘට නොලැබෙන්නේ වුව ද ආත්මනේපද ප්‍රත්‍ය ගනී.[76]

උදා ඃ- සඃ මානවකං ගර්ධයතේ (ඔහු මානවකයා රවටයි.)

සඃ මානවකං වඤ්චයතේ (ඔහු මානවකයාට වඤ්චා කරයි.)

**සූත්‍රය 1.3.70**

**ලියඃ සම්මානනශාලිනීකරණයෝශ්ච**

ලි ධාතුව ගරු කිරීම්, මැඩපැවැත්වීම් හා

මුලා කිරීම් අර්ථයෙන් යුක්තව ප්‍රයෝජ්‍යක්‍රියා වාචකව යෙදුණ කල්හි ක්‍රියාවේ ඵලය කර්තෘ ද නොලැබුණ ද ආත්මනේපද ප්‍රත්‍ය ගනියි.[77]

උදා :- සඃ ජටාභිරාලාපයතේ (ඔහු ජටාව නිසා ගරුකිරීමට ලක් වේ.)

ශ්‍යෙනො වර්තිකාමුල්ලාපයතේ (උකුස්සා අටිකුකුළා අල්ලා ගනී.)

කස්ත්වාමුල්ලාපයතේ? (ඔබව රවටන්නේ කවු ද?)

**සූත්‍රය 1.3.71**

**මිථ්‍යෝපපදාත් කෘඤෝ(අ)භ්‍යාසේ**

ප්‍රයෝජ්‍ය ක්‍රියා වාචක කෘ ධාතුව මිථ්‍යා යන උප පදය සමඟ පුන පුනා වූ සාවද්‍ය ප්‍රකාශනාර්ථයෙන් යෙදේ නම් ක්‍රියාවේ ඵලය කර්තෘට නොවන කල්හි ද ආත්මනේපද ගනී.[78]

උදා :- සඃ පදං මිථ්‍යා කාරයතේ. (ඔහු නැවත නැවත් පදය වැරදි ලෙස උච්චාරණය කරයි.)

**සූත්‍රය 1.3.72**

**ස්වරිතඤිතඃ කර්ත්‍රභිප්‍රායෙ ක්‍රියාඵලේ**

ස්වරිත ස්වරය හෝ ඤිත් සහිත වූ ධාතුව ක්‍රියා ඵලය කර්තෘටම පැවරෙන කල්හි ආත්මනේපද ගනී.[79]

උදා :- (ඤිත් ධාතු) ණීඤ් - සඃ පුෂ්තකම් නයතේ (ඔහු පොත (තම ප්‍රයෝජනය සඳහා) ගෙනයයි.)

සඃ පුෂ්තකම් නයති. (ඔහු (වෙනත් අයෙකු සඳහා) පොත ගෙනයයි.)

ස්වරිත - මාතා ඔදනං පචති (මව තමාට ආහර පිසී.)

මාතා ඔදනං පචතේ (මව (දරුවන් සඳහා) ආහාර පිසී.)

**සූත්‍රය 1.3.73**

**අපාද්වදඃ**

ක්‍රියාවේ ඵලය කර්තෘට ලැබෙන කල්හි අප පූර්ව වද් ධාතුව ආත්මනේපදී වේ.[80]

උදා :- ධනකාමෝ න්‍යායමපවදතේ (ධනයට කැමැත්තා යුක්තියට නිගරු කරයි.)

**සූත්‍රය 1.3.74**

**ණිචශ්ච**

ධාතුවක අවසානයේ ප්‍රයෝජ්‍ය ක්‍රියාර්ථක ණි යෙදී ක්‍රියාවේ ඵලය කර්තෘට පැමිණෙන විට ආත්මනේපදී වේ.[81]

උදා :- සඃ ඔදනං පාචයතෙ. (ඔහු ආහාර පිසවයි.)

**සූත්‍රය 1.3.75**

**සමුදාඞ්භ්‍යෝ යමෝ(අ)ග්‍රන්ථේ**

සම්, උත්, අන් උපසර්ගවලින් එකක් පූර්ව කොට ඇති යම් ධාතුව ග්‍රන්ථවිෂය ප්‍රයෝග යකට අදාළ නොවන කල්හි සහ ක්‍රියාවේ ඵලය කර්තෘට ලැබෙන කල්හි ආත්මනේපද වේ.[82]

උදා :- සඃ ව්‍රීහීන් සංයච්ඡතේ (ඔහු වී රැස් කරයි.)

සඃ භාරමුද්‍යච්ඡතේ (ඔහු බර උසුලයි.)

වස්ත්‍රමායච්ඡතේ (ඔහු වස්ත්‍රය අඳියි.)

**සූත්‍රය 1.3.76**

**අනුපසර්ගාජ්ඥඃ**

ඥා ධාතුව උපසර්ගයකින් තොරව යෙදේ නම් සහ ක්‍රියාවේ ඵලය කර්තෘට වේ නම් ආත්මනේපද වේ.[83]

උදා :- සඃ ගාං ජානීතේ (ඔහු ගවයන් හඳුනාගනී.)

**සූත්‍රය 1.3.77**

**විභාෂෝපපදේන ප්‍රතීයමානේ**

ඵලය උපපදයකින් ක්‍රියා පදයට යෙදෙමින් ක්‍රියාවේ ඵලය කර්තෘට ලැබේ නම් එම ක්‍රියාව විකල්පයෙන් ආත්මනේපදයෙහි යෙදේ. පෙර සූත්‍ර පහ (1.3.72 සිට 1.3.76 දක්වා) ක්‍රියාවෙහි ඵලය කර්තෘ වෙත පැමිණීම ආත්මනේපද ප්‍රත්‍ය යෙදී මෙන් ම කරන ලදි. නමුත් එම අදහස උපපදයකින් ප්‍රකාශ කෙරෙන විට ආත්මනේපදයේ අනිවාර්ය අවශ්‍යතාව ඉවත් කිරීමක් මෙම සූත්‍රයෙන් සිදු කෙරේ. ඒ අනුව ආත්මනේපද භාවිතය විකල්පයෙන් වේ.

උදා :- ස්වං යඥං යජති හෝ යජතේ

ස්වං සටං කරෝති හෝ කුරුතේ

ස්වං පුත්‍රමපවදති හෝ අපවදතේ

ස්වං ඔදනං පාචයති හෝ පාචයතේ

**සමාලෝචනය**

මෙම පර්යේෂණය ''ආත්මනේපදය පිළිබඳ අෂ්ටාධ්‍යායී සහ කාශිකාවෘත්ති ආශ්‍රිත අධ්‍යයනයක්'' යන මාතෘකාව යටතේ, සංස්කෘත භාෂාවේ ආත්මනේපදය පිළිබඳ ව ගැඹුරු විමසුමක් වේ. විශේෂයෙන් ම ආත්මනේපද භාවිතය පිළිබඳ විද්‍යාර්ථීන්ට පහසුවෙන් අවබෝධ කර ගැනීමේ අරමුණින් මෙම අධ්‍යයනය සිදු කෙරිණි. ආත්මනේපදයෙහි ස්වභාවය, ක්‍රියාපද ව්‍යවස්ථාවේ එහි සුවිශේෂ භාවිතය, සහ භාෂාවේ සංකීර්ණ ක්‍රමයන් තුළ එය දරන තැන තවදුරටත් පැහැදිලි කිරීම මෙහි ප්‍රධාන අරමුණු විය. පර්යේෂණය තුළ, ආත්මනේපදයෙහි ව්‍යුත්පත්තික අර්ථය, භාවිතය සහ වෙනත් පද විභක්ති පද්ධති සමඟ එහි සබඳතා පිළිබඳ විශ්ලේෂණයකි. විශේෂයෙන්ම සංස්කෘත භාෂාවේ තුන් ආකාර ක්‍රියා පද පද්ධතිය (පරස්මපද, ආත්මනේපද, උභයපද) තුළ ආත්මනේපදයට ඇති විශේෂ ස්ථානය සෙවීමට මෙය උපකාර විය. විද්‍යාර්ථීන්ට සංකීර්ණ ග්‍රන්ථ විෂයයන් පහසුවෙන් අවබෝධ කර ගැනීමට පහසු පදනමක් සකස් කිරීමේ අරමුණ මෙම අධ්‍යයනයෙන් සාර්ථකව ඉටු කළ හැකි විය. පර්යේෂණයේ දී සම්භාව්‍ය සංස්කෘත ග්‍රන්ථ මූලාශ්‍රවලින් දත්ත රැස් කිරීම, ඒවායේ ආත්මනේපද භාවිතයන් පරීක්ෂා කිරීම සිදු විය. මෙය සරල භාෂාවෙන් විද්‍යාර්ථීන්ට ප්‍රදානය කිරීමේ වගකීම ද සමඟ කරන ලද්දකි. සංස්කෘත විෂය උගන්වන ගුරුවරුන්ට ද මෙය ප්‍රයෝජනවත් වනු ඇත. තරමක් සංකීර්ණ ව්‍යාකරණමය අංශයක් ලෙස සැලකෙන ආත්මනේපදය, ව්‍යාකරණය තුළ වඩාත් සාධාරණ, සැලකිලිමත් විග්‍රහයකට ලක් කරමින් එහි සැබෑ වටිනාකම විවෘත කිරීමත්, සංස්කෘත භාෂාවට ඇති විද්‍යාත්මක හා දාර්ශනික භාවය විඳ ගැනීමට ද මෙය උපකාර වේ.

**ආන්තික සටහන්**

1. අවිශේෂේණ ධාතෝරාත්මනේපදං පරස්මෛපදං ච විධාස්‍යතේ, තත්‍රායං නියමඃ ක්‍රියතේ. අනුදාත්තේතෝ යේ ධාතවෝ ඞිතශ්ච තේභ්‍ය ඒවාත්මනේපදං භවති නාන්‍යෙභ්‍යඃ. (කාශිකාවෘත්ති, 21-22 පිටු.)
2. භාවේ කර්මණි චාත්මනේපදං භවති. (කාශිකාවෘත්ති, 23 පිට.)
3. ක්‍රියාවිනිමයේ දෙ‍ෝත්‍යෙ කර්තර්යාත්මනේපදම්. (ලඝුසිද්ධාන්තකෞමුදී 396 පිට)
4. කර්මශබ්දඃ ක්‍රියවාචී. ව්‍යතිහාරෝ විනිමයඃ. යත්‍රාන්‍යසම්බන්ධිනීං ක්‍රියාමන්‍යඃ කරෝති, ඉතරසම්බන්ධිනීං චේතරඃ, ස කර්මව්‍යතිහාරඃ (කාශිකාවෘත්ති, 24 පිට.)
5. ගත්‍යර්ථෙභ්‍යො හිංසාර්ථෙභ්‍යශ්ච ධාතුභ්‍යඃ කර්මව්‍යතීහාරේ ආත්මනෙපදං න භවති. (කාශිකාවෘත්ති, 26 පිට.)
6. ඉතරේතරඃ, අන්‍යෝන්‍යඃ ඉත්‍යෙවමුපපදාද්ධාතෝඃ කර්මව්‍යතිහාරේ ආත්මනේපදං න භවති. (කාශිකාවෘත්ති, 27 පිට.)

7. නිපූර්වාද්විශ ආත්මනේපදං විධියතේ. (කාශිකාවෘත්ති, 27 පිට.)

8. පරිව්‍යවේභ්‍ය උත්තරස්මාත් ක්‍රීණාතේරාත්මනේපදං භවති. (කාශිකාවෘත්ති, 29 පිට.)

9. විපරා පූර්වාජ් ජයතේර් ධාතෝරාත්මනේපදං භවති. (කාශිකාවෘත්ති, 29 පිට.)

10. නීලෙශවෘත්ති/ මුබසය උද්ඝාටනම් ඒතමර්ථම් වර්ජයිත්වා අන්‍යෙෂු අර්ථේෂු 'ආඞ්' උපසර්ගාත් 'දා' ධාතෝඃ ආත්මනේපදස්‍ය ප්‍රත්‍යයාඃ භවන්ති.

11. ආස්‍යවිහරණසමානක්‍රියාදපි ප්‍රතිෂේධෝ වක්තව්‍යඃ (කාශිකාවෘත්ති, 30 පිට.)

12. ස්වාඞ්ගකර්මකාච් ච ඉති වක්තව්‍යම්. ඉහ මා භූත් (කාශිකාවෘත්ති, 31 පිට.)

13. ක්‍රීඩ් විහාරේ, ඒතස්මාදනු සම් පරි ඉත්‍යෙවං පූර්වාදාඞ්පූර්වාච් චාත්මනේපදං භවති. (කාශිකාවෘත්ති, 31 පිට.)

14. ආගමේඃ ක්ෂමායාම් ආත්මනේපදං වක්තව්‍යම්. (කාශිකාවෘත්ති, 32 පිට.)

15. ශික්ෂේර්ජිඥාසායාම්. (කාශිකාවෘත්ති, 32 පිට.)

16. ආශිෂි නාථඃ (කාශිකාවෘත්ති, 32 පිට.)

17. හරතේර්ගතතාච්ඡිල්‍යෙ. (කාශිකාවෘත්ති, 33 පිට.)

18. කිරතේර්හර්ෂජීවිකාකුලායකරණේෂ්විති වක්තව්‍යම්. (කාශිකාවෘත්ති, 33 පිට.)

19. ආඞ් නුප්‍රච්ඡෝ්‍යර්‍රුපසඞ්ඛ්‍යානම්. (කාශිකාවෘත්ති, 33 පිට.)

20. ශප උපලම්භන ඉති වක්තව්‍යම්. වාචා ශරීරස්පර්ශනම් උපලම්භනම්. (කාශිකාවෘත්ති, 33 පිට.)

21. සම් අව ප්‍ර වි ඉත්‍යෙවං පූර්වාත් තිෂ්ඨතේරාත්මනේපදං භවති. (කාශිකාවෘත්ති, 34 පිට.)

22. ආඞඃස්ථඃ ප්‍රතිඥාන ඉති වක්තව්‍යම්. (කාශිකාවෘත්ති, 34 පිට.)

23. ප්‍රකාශනේ ස්ථේයා(අ)ඛ්‍යායාං ච තිෂ්ඨතේරාත්මනේපදං භවති. (කාශිකාවෘත්ති, 35 පිට.)

24. උත්පූර්වාත්තිෂ්ඨතේරනූර්ධ්වකර්මණි වර්තමානාදාත්මනේපදං භවති. (කාශිකාවෘත්ති, 36 පිට.)

25. උපපූර්වාත්තිෂ්ඨතේර්මන්ත්‍රකරණේ(අ)ර්ථේ වර්තමානාදාත්මනේපදං භවති. (කාශිකාවෘත්ති, 37 පිට.)

26. උපාද් දේවපූජාසඞ්ගතකරණමිත්‍රකරණපථිෂ්විති වාච්‍යම්. (කාශිකාවෘත්ති, 37 පිට.)

27. උපපූර්වාත්තිෂ්ඨතේරකර්මකාදකර්මකක්‍රියාව චනාදාත්මනේපදං භවති. (කාශිකාවෘත්ති, 38 පිට.)

28. උත් වි ඉත්‍යෙවංපූර්වාත් තපතේරකර්මකක්‍රියාවචනාදාත්මනේපදං භවති. (කාශිකාවෘත්ති, 38 පිට.)

29. යම උපරමේ,හන හිංසාගත්‍යෝඃ ඉති පරස්මෛපදිනෞ. තාභ්‍යාමකර්මකක්‍රියාවච නාභ්‍යාමාඞ්පූර්වාභ්‍යාමාත්මනේපදං භවති. (කාශිකාවෘත්ති, 39 පිට.)

30. ස්වාඞ්ගකර්මකාච්චේති වක්තව්‍යම්. (කාශිකාවෘත්ති, 39 පිට.)

31. සංපූර්වේභ්‍යෝ ගමි ඍච්ඡි ප්‍රච්ඡි ස්වරති අර්ති ශ්‍රු විදි ඉත්‍යෙතේභ්‍යෝ(අ)කර්මකේභ්‍යෝ ධාතුභ්‍ය ආත්මනේපදං භවති. (කාශිකාවෘත්ති, 40 පිට.)

32. දෘශේශ්චේති වක්තව්‍යම්. (කාශිකාවෘත්ති, 41 පිට.)

33. නි සම් උප වි ඉත්‍යෙවංපූර්වාද් හ්වයතේර්ධාතෝරාත්මනේපදං භවති. (කාශිකාවෘත්ති, 42 පිට.)

34. ස්පර්ධායාං විෂය ආඞ්පූර්වාද් හ්වයතේරාත්මනේපදං භවති. (කාශිකාවෘත්ති, 42 පිට.)

35. ගන්ධනාදිෂ්වර්ථේෂු වර්තමානාත් කරෝතේරාත්මනේපදං භවති. (කාශිකාවෘත්ති, 43 පිට.)

36. අධිපූර්වාත් කරෝතේඃ ප්‍රහසනෙ වර්තමානාදාත්මනෙපදං භවති. (කාශිකාවෘත්ති, 45 පිට.)

37. විපූර්වාත් කරෝතේරකර්ත්‍රභිප්‍රායෙ ක්‍රියාඵලේ ශබ්දකර්මණ ආත්මනේපදං භවති. (කාශිකාවෘත්ති, 45 පිට.)

38. විපූර්වාත් කරෝතේරකර්මකාදකර්මකක්‍රියාව චනාදාත්මනේපදං භවති. (කාශිකාවෘත්ති, 46 පිට.)

39. ණීඤ් ප්‍රාණණේ, ඉත්‍යෙතස්මාද්ධාතෝරාත්මනේපදං භවති සම්මානනාදි විශේෂණේෂු සත්සු. (කාශිකාවෘත්ති, 46 පිට.)

40. කර්තෘස්ථෙ කර්මණ්‍යශරීරේ සති නයතෙරාත්මනෙපදං භවති. (කාශිකාවෘත්ති, 48 පිට.)

41. වෘත්ත්‍යාදිෂ්වර්ථේෂු ක්‍රමේර්ධාතෝරාත්මනේපදං භවති. (කාශිකාවෘත්ති, 49 පිට.)

42. සෝපසර්ගාදුපපරාපූර්වාදේව, නාන්‍යපූර්වාදිති. (කාශිකාවෘත්ති, 50 පිට.)

43. ආඞ්පූර්වාත් ක්‍රමතේරුද්ගමනේ වර්තමානාදාත්මනේපදං භවති. (කාශිකාවෘත්ති, 50 පිට.)

44. ජ්‍යෝතිරුද්ගමන ඉති වක්තව්‍යම්. (කාශිකාවෘත්ති, 50 පිට.)

45. විපූර්වාත් ක්‍රමතේඃ පාදවිහරණේ(අ)ර්ථේ වර්තමානාදාත්මනේපදං භවති. (කාශිකාවෘත්ති, 51 පිට.)

46. ප්‍ර උප ඉත්‍යෙතාභ්‍යාමුපසර්ගාභ්‍යාං පරස්මාත් ක්‍රමතේරාත්මනේපදං භවති. (කාශිකාවෘත්ති, 51 පිට.)

47. උපසර්ගවියුක්තාත් ක්‍රමතේරාත්මනේපදං වා භවති. (කාශිකාවෘත්ති, 52 පිට.)

48. ජානාතේරපහ්නවේ වර්තමානාදාත්මනේපදං භවති. (කාශිකාවෘත්ති, 52 පිට.)

49. ජානාතේරකර්මකාදකර්මකක්‍රියාවචනාදාත්මනේ පදං භවති. (කාශිකාවෘත්ති, 53 පිට.)

50. සං ප්‍රති ඉත්‍යෝවංපූර්වාද් ජානාතේරනාධ්‍යානේ වර්තමානාදාත්මනේපදං භවති. (කාශිකාවෘත්ති, 53 පිට.)

51. භාසනාදිෂු විශේෂණේෂු සත්සු වදතෙරාත්මනේපදං භවති. (කාශිකාවෘත්ති, 54 පිට.)

52. ව්‍යක්තවාචාං සමුච්චාරණං සහෝච්චාරණම්, තත්‍ර වර්තමානාද් වදතේරාත්මනේපදං භවති. (කාශිකාවෘත්ති, 55 පිට.)

53. ව්‍යක්තවාච ඉති හි මනුෂ්‍යාඃ ප්‍රසිද්ධාඃ (කාශිකාවෘත්ති, 55 පිට.)

54. අනුපූර්වාද් වදතේරකර්මකාද් ව්‍යක්තවාග 'විෂයාදාත්මනේපදං භවති. (කාශිකාවෘත්ති, 56 පිට.)

55. ව්‍යක්තවාචාං සමුච්චාරණ ඉති ච. විප්‍රලාපාත්මකේ ව්‍යක්තවාචාං සමුච්චාරණේ වර්තමානාද් වදතේරාත්මනේපදං භවති විභාෂා. (කාශිකාවෘත්ති, 57 පිට.)

56. අවපූර්වාද් ගිරතේරාත්මනේපදං භවති. (කාශිකාවෘත්ති, 57 පිට.)

57. සංපූර්වාද් ගිරතේඃ ප්‍රතිඥානේ වර්තමානාදාත්මනේපදං භවති. (කාශිකාවෘත්ති, 58 පිට.)

58. උත්පූර්වාච් චරතේඃ සකර්මකක්‍රියාවචනාදාත්මනේපදං භවති. (කාශිකාවෘත්ති, 58 පිට.)

59. සංපූර්වාච්චරතේස්තෘතීයායුක්තාදාත්මනේපදං භවති. (කාශිකාවෘත්ති, 58 පිට.)

60. සංපූර්වාත් තෘතීයායුක්තාදාත්මනේපදං භවති, සා චේත් තෘතීයා චතුර්ථ්‍යර්ථේ භවති. (කාශිකාවෘත්ති, 59 පිට.)

61. උපපූර්වාද් යමඃ ස්වකරණේ වර්තමානාදාත්මනේපදං භවති. පාණිග්‍රහණවිශිෂ්ටමිහ ස්වකරණං ගෘහ්‍යතේ. (කාශිකාවෘත්ති, 61 පිට.)

62. ඥා ශ්‍රු ස්මෘ දෘශ් ඉත්‍යෙතේෂාං සන්නන්තානාමාත්මනේපදං භවති. (කාශිකාවෘත්ති, 61 පිට.)

63. අනුපූර්වාජ් ජානාතේඃ සන්නන්තාදාත්මනේපදං න භවති. (කාශිකාවෘත්ති, 62 පිට.)

64. තථා ච සති සකර්මකසේ‍යවායං ප්‍රතිෂේධඃ සංපද්‍යතේ. (කාශිකාවෘත්ති, 62 පිට.)

65. ප්‍රති ආඞ්ඉත්‍යෙවංපූර්වාච්ඡෘණෝතේඃ සන්නන්තාදාත්මනේපදං න භවති. (කාශිකාවෘත්ති, 62 පිට.)

66. ශදිර්යඃ ශිත්, ශිද්භාවී ශිතෝ වා සම්බන්ධී තස්මාදාත්මනෙපදං භවති. (කාශිකාවෘත්ති, 63 පිට.)

67. ම්‍රියතේර්ලුඞ්ලිඞෝඃ ශිතශ්වාත්මනේපදං භවති. (කාශිකාවෘත්ති, 64 පිට.)

68. ම්‍රියතේර්ලුඞ්ලිඞෝඃ ශිතශ්චාත්මනේපදං භවති නාන්‍යත්‍ර. (කාශිකාවෘත්ති, 64 පිට)

69. සනඃ පූර්වෝ යෝ ධාතුරාත්මනේපදී, තද්වත් සන්නන්තාදාත්මනේපදං භවති. යේන නිමිත්තේන පූර්වස්මාදාත්මනේපදං විධීයතේ, තේනෛව සන්නන්තාදපි භවති. (කාශිකාවෘත්ති, 64 පිට.)

70. ආම්ප්‍රත්‍යයෙෙව ධාතෝඃ කෘඤො'නුප්‍රයෝග ස්‍යාත්මනෙපදං භවති. (කාශිකාවෘත්ති, 67 පිට.)

71. ප්‍ර උප ඉත්‍යේවංපූර්වාද් යුජේරයඥපාත්‍රප්‍රයෝග විෂයාදාත්මනේපදං භවති. (කාශිකාවෘත්ති, 69 පිට.)

72. ඤ්ණු තේජනේ පරස්මෛපදී. තතඃ සංපූර්වාදාත්මනේපදං භවති. (කාශිකාවෘත්ති, 70 පිට.)

73. භුජ පාලනාභ්‍යවහාරයෝඃ ඉති රුධාදෞ පඨ්‍යතේ. තස්මාදනවනේ(අ)පාලනේ වර්තමානාදාත්මනේපදං භවති. (කාශිකාවෘත්ති, 71 පිට.)

74. ණ්‍යන්තාදාත්මනේපදං භවති. (කාශිකාවෘත්ති, 72 පිට.)

75. බිභේතේඃ ස්මයතේශ්ච ණ්‍යන්තාදාත්මනේපදං භවති හේතුභයේ. (කාශිකාවෘත්ති, 80 පිට.)

76. අකර්තෘභිප්‍රායාර්ථෝ(අ)යමාරම්භඃ. ගෘධු අභිකාඞ්ක්ෂායාම්, වඤ්චු ගතෞ ඉත්‍යතයෝර්ණ්‍යන්තයෝඃ ප්‍රලම්භනේ වර්තමානයෝරාත්මනේපදං භවති. (කාශිකාවෘත්ති, 81 පිට.)

77. ලියෝ ණ්‍යන්තාත් සංමානනේ ශාලීනීකරණේ ච වර්තමානාදාත්මනේපදං භවති, ච ශබ්දාත් ප්‍රලම්භනේ ච.(කාශිකාවෘත්ති, 81-82 පිටු.)

78. ණ්‍යන්තාත් කරෝතේර්මිථ්‍යෝපපදාදාත්මනේපදං භවත්‍යභ්‍යාසේ. (කාශිකාවෘත්ති, 82 පිට.)

79. ස්වරිතේතෝ යේ ධාතවෝ ඤිතශ්ච තේභ්‍ය ආත්මනේපදං භවති. (කාශිකාවෘත්ති, 83 පිට.)

80. අපපූර්වාද් වදතේඃ කර්තෘභිප්‍රායේ ක්‍රියාඵල ආත්මනේපදං භවති. (කාශිකාවෘත්ති, 84 පිට.)

81. ණිජන්තාදාත්මනේපදං භවති කර්තෘභිප්‍රායේ ක්‍රියාඵලේ. (කාශිකාවෘත්ති, 85 පිට.)

82. සම් උද් ආඞ්ඉත්‍යේවංපූර්වාද් යමේඃ කර්තෘභිප්‍රායේ ක්‍රියාඵල ආත්මනේපදං භවති, ග්‍රන්ථවිෂයශ්චේත් ප්‍රයෝගෝ න භවති. (කාශිකාවෘත්ති, 86 පිට.)

83. අනුපසර්ගාජ් ජානාතේඃ කර්තෘභිප්‍රායේ ක්‍රියාඵල ආත්මනේපදං භවති. (කාශිකාවෘත්ති, 86 පිට.)

## මූලාශ්‍රය


Tripathi, J.S.L. & Malaviya, S., eds., 1925. Kāsikā: A Commentary on Pāṇini's Grammar, Volume II (Adhyāya 1.3–2.2). Varanasi: Banaras Hindu University.

Vasu, Ś.C., 1891. The Ashtadhyayí of Panini. Translated into English. Allahabad: Indian Press.


## වෙබ් පිටු


SanskritDocuments, 2025. Sarvanisutrāṇi 1.3.20. Available at: https://sanskritdocuments.org/ learning_tools/ sarvanisutrani/ 1.3.20.htm (Accessed: 3 to 30 August 2025).

Ashtadhyayi.github.io, 2025. Pāṇinīya Mūlasrotaḥ – Suutra 1.3.20 ( āṅgo do'nāsya viharane ). Available at: https://ashtadhyayi.github.io/suutra/1.3/1.3.20/ (Accessed: 3 to 30 August 2025).

Ashtadhyayi.com, 2025. Sūtra SK2686. Available at: https://ashtadhyayi.com/sutraani/sk2686 (Accessed: 3 to 30 August 2025).